# නිවාඩුවට අරුතක් - ක්රියාකාරකම්පත්‍රය

## සිංහල භාෂාව හා සාහිත්‍ය'ය - 10 ශ්‍රේණිය

01) පහත දැක්වෙන මාතෘකා සඳහා වචන 350කට නොඅඩු වන සේ රචනා ලියන්න.

I. වර්තමානයේ විශාල වශයෙන් මිනිස් ජීවිත බිලිගන්නා රෝග අතර "කොවිඩ් 19" හෙවත් නව කොරෝනා වෛරසය ආසාදනය වීම බරපතල ගැටලුවක් බවට පත්ව ඇත. දුප්පත්, පොහොසත් හෝ උගත්, නූගත් කිසිදු භේදයක් නොතකා ලෝකය පුරා ගමන් ගන්නා මෙම භයානක රෝගය සඳහා කිසිදු ඖෂධයක් මේ වනවිට සොයාගෙන නැත. ලෝකය ම එක් ව අත්වැල් බැඳගෙන මෙම වෛරසය හමුවේ නැවත නැගී සිටිය යුතු ය."නව කොරෝනා වෛරසය හමුවේ එක් ව නැගී සිටිමු"යන මැයෙන් රචනයක් ලියන්න.

II. පාසල් අනිවාර්ය විෂය මාලාවෙන් පමණක් පූර්ණ පෞරුෂයකින් හෙබි පුද්ගලයකු බිහි නොවේ. ඒ සඳහා සෑම දරුවකු ම විෂය සමගාමී සහ විෂය බාහිර ක්‍රියාකාරකම්වල නිරතවීම අත්‍යවශ්‍ය වේ. වර්තමාන අධ්‍යාපනයේ ද පාසල් තුළ මේ සඳහා පෙළඹවීමක් දක්නට ලැබේ."සමබර අධ්‍යාපනයකින් හෙට ලොව දිනමු." යන මැයෙන් රචනයක් ලියන්න.

02) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1956 වර්ෂයේ දී මෙරට කලා ක්ෂේත්‍රයේ විශාල පරිවර්තනයක් සිදු විය. මනමේ වේදිකා නාට්‍යය මෙන් ම විරාගය නවකතාව ද බිහිවූයේ මේ වර්ෂයේදී ය. දේශීය සිනමාව කලාවක් බවට පරිවර්තනය වීමේ පළමු සලකුණ තැබූ රේඛාව චිත්‍රපටය බිහිවූයේ ද මේ වර්ෂයේදී ය. ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතාගේ නිර්මාණයක් වූ රේඛාව බොහෝ සිනමා විචාරකයන් හඳුන්වන්නේ මෙරට සිනමාවේ සැබෑ ආරම්භය ලෙසයි.එය මෙරට ප්‍රථම සිනමාරූපී චිත්‍රපටයයි. චිත්‍රපටයේ භාෂාව, ව්‍යාකරණ මෙන් ම අලංකාර සම්ප්‍රදාය ද නිවැරදිව භාවිත කළ රේඛාව සිනමා සෞන්දර්යාත්මක හැඩතල මෙරට සිනමාවට හඳුන්වා දුන්නේ ය. එය නාට්‍ය ආකෘතියෙන් ද දෙමළ මුහුණුවරින් ද සපුරා මිදුණු නිර්මාණයක් විය. දේශීය බව එහි ප්‍රධාන ගුණය විය.සිනමා කෘතියකට උචිත තිර රචනයක් පළමු වරට සම්පාදනය වූයේ රේඛාව උදෙසා ය. මෙරට ගැමි ජීවිතය විවරණය කිරීම එහි අරමුණ විය.

I. 1956 හෙළ කලාවේ සුවිශේෂ වර්ෂයක් වීමට හේතු වූ කරුණු දෙකක් ලියන්න.

II. රේඛාව චිත්‍රපටයේ නිර්මාණකරු නම් කරන්න.

III. රේඛාව චිත්‍රපටය නිර්මාණය කිරීමේ අරමුණ කුමක් ද?

IV. රේඛාව චිත්‍රපටය බැහැර කළ අංග දෙකක් ලියන්න.

V. ඉහත සඳහන් ඡේදයේ ඇතුළත් උපසර්ග පද දෙකක් ලියා දක්වන්න.

03) ඔබ දිවුල්ගල ප්‍රජා සංවර්ධන සමිතියේ ලේකම් යයි සිතා මේ වනවිට ශ්‍රී ලංකාව පුරා ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් පවතින කොරෝනා වෛරස ආසාදනය පිළිබඳ ව ගම්වාසීන් දැනුම්වත් කිරීමේ වැඩසටහනකට සහභාගී වීමට පැමිණෙන ලෙස දන්වා දිවුල්ගල මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා වෙත රාජකාරී ලිපියක් ලියන්න.

04) පහත සඳහන් ඡේදය කියවා එහි සාරාංශය වචන 45-50 අතර ප්‍රමාණයකින් ලියන්න.

සාහිත්‍ය නිර්මාණ අතරින් කවිය හෙවත් කාව්‍යයට විශේෂ ස්ථානයක් හිමි වේ. රමණීය අදහස් හා අරුත් දනවෙන පරිදි කරන භාෂාමය නිර්මාණය කවිය යි. කවි නිර්මාණය කරන්නේ කවියා ය. කවියකු බිහිවීමට හේතු තුනක් බලපාන බව පෙරදිග විචාරකයෝ පවසති. එනම් ප්‍රතිභාව, ව්‍යුත්පත්තිය හා සතතාභ්‍යාසයයි. ප්‍රතිභාව යනු තමා විඳින අත්දැකීම් ඇසුරෙන් අපූර්ව සිතිවිලි පහළ කර ගැනීමේ හැකියාව යි. ව්‍යුත්පත්තිය යනු කාව්‍ය නිර්මාණකරණය මෙන් ම විවිධ ශාස්ත්‍ර හා විෂය සම්බන්ධ පරිණත අවබෝධයයි. සතතාභ්‍යාසය යනු නිර්මාණකරණයෙහි නිරන්තරව යෙදෙමින් ලබාගන්නා ප්‍රාගුණ්‍යයයි. පුරාණ භාරතයේ විසූ අභිනවගුප්ත නම් පඬිවරයා ප්‍රතිභාව විග්‍රහ කොට ඇත්තේ අපූර්ව වස්තු නිර්මාණය කිරීමේ දක්ෂතාවය ලෙස ය.කවියාගේ ප්‍රතිභාව වූ කලී අත්දැකීම් යළි යළිත් සිහි කිරීමෙන් නැතහොත් පරිකල්පනයෙන් පෝෂණය ලබන්නකි. පරිකල්පනය මූලික ක්‍රියා තුනක ඵලයක් සේ විස්තර කෙරේ. එම ක්‍රියා නම් විවිධ සිදුවීම් සිතට කා වැදීම, එම සිදුවීම් ස්මෘතියෙහි ප්‍රතිනිර්මාණය වීම හා එම ස්මෘති සටහන් මඟින් නව සංකල්ප බිහිවීම ය. මේ අනුව පසිඳුරන්ට ගොදුරුවන කුඩු මහත් හැම දෙයක් මෙන් ම මනසෙහි පහළවන අදහස් කවියා අතින් විචිත්‍රත්වයට හා අපූර්වත්වයට පත් වෙයි.

05) I.මේ දිනවල ඔබ ශ්‍රවණය කළ මව්ගුණ ගීත තුනක හා පියගුණ ගීත දෙකක මුල් පද පේළි ලියා දක්වන්න.

II. ඔබ ශ්‍රවණය කළ දේශාභිමානී ගීතයක් සම්පූර්ණයෙන් ලියා දක්වන්න.

III. ඉහත සඳහන් ගීතය පිළිබඳව ඔබ තුළ ඇති වූ හැඟීම් ඇසුරෙන් කෙටි රසාස්වාදයක් ලියන්න.

06) I. සිංහල සාහිත්‍ය සංග්‍රහයේ එන පහත සඳහන් පාඩම් ඇසුරෙන් පාඩම් <u>**තුනකින්**</u> කෙටි ප්‍රශ්න **20 බැගින්** සකස් කරන්න.

I.සතර කන් මන්ත්‍රණය II.ගුත්තිල වෙණ නද III.හානා හීය පානා අඬහැරෙන් දනේ

IV.බැද්දේගම V.මුනි සිරිපා සිඹිමින්නේ VI.ගංගාවේ සංගීතය

VII.ලෙන අතහැර යෑම

II. ඔබට සාහිත්‍ය සංග්‍රහයේ පාඩම් ඒකක පරිශීලනයේ දී හමු වූ දුරවබෝධ වචන ලැයිස්තුවක් සකස් කරන්න.

III.ඉහත සඳහන් කළ එක් සාහිත්‍ය නිර්මාණයක් තෝරාගෙන එම සාහිත්‍ය නිර්මාණය පිළිබඳ ව ඔබ තුළ ඇති වූ හැඟීම් ඇසුරෙන් රසාස්වාදයක යෙදෙන්න.

07)I. 10 ශ්‍රේණියේ පෙළ පොතේ සඳහන් ලේඛකයන් හා ගීත රචකයන් නම් කරන්න.

II. ඉහත සඳහන් කරන ලද ලේඛකයන්ගේ හා ගීත රචකයන්ගේ නිර්මාණය බැගින් ලියා දක්වන්න.

08) මෙම නිවාඩු කාලයේදී ඔබ කියවූ නවකතාවක්, කෙටි කතාවක් හෝ පරිවර්තන ග්‍රන්ථයක් පිළිබඳව කෙටි විචාරයක් ලියන්න.